# Path to Success - Study Pack

## 2021 දෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## කතෝලික ධර්මය - 11 ශ්‍රේණිය



**අධ්‍යාපන සංවර්ධන අංශය**

**කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය**

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී. ඉරෝෂනී කේ. පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ.පී. සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

**විෂය සම්බන්ධීකරණය**

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

**සැකසුම**

ගරු නුවන් චතුරංග පියතුමා
බප/කැල/ සාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල

පී.ඩී. පිලිෂියා අයිරින් මිය
කතෝලික ධර්මය ගුරු උපදේශක ( කැලණිය කලාපය )

අරුනි නිශාන්ති මිය
බප/කැල/ ක්‍රිස්තුරාජ විද්‍යාලය හේකිත්ත, වත්තල

ගයනි රූපිකා මිය
බප/කැල/ ක්‍රිස්තුරාජ විද්‍යාලය හේකිත්ත, වත්තල

**සියලුම හිමිකම් ඇවිරිණි.**

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 09 වන පාඩම -ස්නාවක ජුවාම් තුමා

- **කොවිඩ් 19 වසංගත සමය තුළ ඔබට පැමිණෙන අභියෝග ජය ගැනීමට අවශ්‍ය වරම් පතා දෙවිඳුන් යදිමු.**
- **11 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළපොත ඇසුරෙන් දෙවන වාරයට අදාළ මෙම අභ්‍යාස සම්පූර්ණ කරන්න.**



1. ස්නාවක ජුවාම් තුමාව හඳුන්වන වෙනත් නම් ලියන්න.
2. ස්නාවක ජුවාම් තුමාට පැවරුණු සුවිශේෂ දේව කාර්යය කුමක් ද?
3. ස්නාවක ජුවාම් තුමා සිය දූත කාර්යය ආරම්භ කළේ කුමන ප්‍රදේශයේ ද?
4. ස්නාවක ජුවාම් තුමා පිළිබඳව ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම කුමක් ද?
5. ස්නාවක ජුවාම් තුමාගේ වගකීම වූයේ කුමක් ද?
6. දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස්ට ලැබුණ විපාකය කුමක් ද?
7. ග්‍රාබියෙල් දේවදූතයා සෙකරියස් තුමාට ස්නාවක ජුවාම් තුමාගේ උපත දැනුම් දෙන අවස්ථාවේ ස්නාවක ජුවාම් තුමා පිළිබඳ කළ ප්‍රකාශ මොනවා ද?
8. ස්නාවක ජුවාම් තුමා දේශනා කළ ජන කණ්ඩායම් නම් කරන්න.
9. ස්නාවක ජුවාම් තුමා අභියෝගාත්මකව ඉශ්රායෙල් ප්‍රභූ ජනතාව ඇමතුවේ කෙසේ ද?
10. ස්නාවක ජුවාම් තුමා දේශනා කළ කණ්ඩායම්වලට ලබා දුන් පණිවිඩය වර්තමාන සමාජයට ගළපමින් පෙළගස්වන්න.
11. ස්නාවක ජුවාම් තුමාගේ මරණයට ප්‍රධාන හේතුව කුමක් ද?
12. ශු. සභා මාතාව ජනවන්දනා වසරේ මනස්ථාපනයේ වකවානු මොනවා ද?
13. මෙතුමාගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ හතරක් ලියන්න.
14. ස්නාවක ජුවාම් තුමාගේ සිත් හැරීමේ දේශනා අනුව යමින් අප තුළ ආකල්පමය වෙනසක් ඇති කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
15. ඔබ පාසල තුළ සැබෑ දිවැසිවරයකු ලෙස කටයුතු කළ අවස්ථාවක් කෙටියෙන් ලියන්න.

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 10 වන පාඩම -ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර



1. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ වන්නේ කුමකින් ද? එහිදී සිදුවූ ප්‍රධානතම සිදුවීම කුමක් ද?
2. ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබූ අවස්ථාවේ අහසින් නික්මුණ හඬ කුමක් ද?
3. ජේසුස් වහන්සේ බෞතීස්මය ලබා පළමුවෙන්ම කළ දේවල් දෙකක් ලියන්න.
4. ජේසුස් වහන්සේ දූත කාර්යය ආරම්භයේදී මූණ දුන්නේ කුමකට ද?
5. ජේසුස් වහන්සේගේ දූත කාර්යයේ අරමුණ කුමක් ද?
6. ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා හා උන්වහන්සේ දුන් පිළිතුර කුමක් ද?
7. ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා වලින් අපට ලැබෙන පණිවුඩ තුනක් ලියන්න.
8. ක්‍රිස්තුන් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා 03 වර්තමාන සමාජයට ගළපමින් පෙළගස්වන්න.
9. **"ප්‍රාතිහාර්යයක්"** යනු කුමක් ද?
10. ශුද්ධ වූ අගුස්තීනු තුමාට අනුව ප්‍රාතිහාර්යයක් යනු කුමක් ද?
11. ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යය සිදු කිරීම මගින් සනාථ කළේ කුමක් දැයි කරුණු 03 ක් පෙළ ගස්වන්න.
12. ප්‍රධාන ප්‍රාතිහාර්යය වර්ග නම් කර ඒවාට උදාහරණ දෙන්න.
13. ප්‍රාතිහාර්යය සිදුවීමට ඇදහිල්ල අවශ්‍ය බවට නිදසුන් 2 ක් දක්වන්න.
14. හැත්තෑ දෙනා පිළිබඳ බයිබල් විශාරදයන්ගේ මතය කුමක් ද?
15. ඒ අනුව හැත්තෑ දෙනා යැවීමෙන් අදහස් වන්නේ කුමක් ද?

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 11 වන පාඩම -දේව රාජ්‍යය



1. දේව රාජ්‍යය යනු කුමක් ද?
2. දේව රාජ්‍යය හා ලෞකික රාජ්‍යය අතර ඇති වෙනස කුමක් ද?
3. කතෝලික සභා ධර්මෝපදේශය දේව රාජ්‍ය පිළිබඳව ප්‍රකාශ කරන්නේ කුමක් ද?
4. දේව රාජ්‍යයේ වටිනාකම් උගන්වන උපමා හතරක් නම් කරන්න.
5. වපුරන්නාගේ උපමාව ගැන විවරණයක් කරන්න.
6. කන්ද උඩ දේශනාවේ අඩංගු වී ඇති ඉගැන්වීම් හතරක් ලියන්න.
7. අප අතර පවතින දේව රාජ්‍ය ළඟා කර ගැනීමේ ආශාවා මුදුන්පත් කර ගැනීමට නම් අප කළ යුත්තේ කුමක් ද?
8. භාග්‍ය අට තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් ජේසු සමිඳුන් කෙලෙස ඉදිරිපත් කරන්නේ ද?
9. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවන්ගේ හරය වූයේ කුමක් ද?
10. දේව රාජ්‍යයේ වටිනාකම් ශ්‍රී ලංකාවේ සාරධර්ම හා පෙළ ගස්වන්න.
11. දෙවියන් වහන්සේගේ රාජ්‍ය කොතැනක කවර කලෙක පහළ වන්නේ දැයි පරිසිවරු ඇසූ ප්‍රශ්නයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක් ද?
12. මතෙව් 13:24-30 සඳහන් කිරිදි පිළිබඳ උපමාව කියවා එහි අර්ථය කෙටියෙන් ලියන්න.
13. "දේව රාජ්‍යයේ ගුණාංග වර්ධනය කිරීමට මාගේ දායකත්වය" රචනාවක් ලියන්න.
14. මතෙව් 6:1-4 සඳහන් පරිදි දන්දීම පිළිබඳ ඉගැන්වීම වර්තමාන සමාජය හා සසඳමින් පැහැදිලි කරන්න.
15. භාග්‍ය අට ප්‍රයෝජනයට ගනිමින් අප තුළ හා අප අතර දේව රාජ්‍යය ගොඩ නැගීමට ඔ ක්‍රියා ක්‍රියා කරන ආකාරය කරුණු පහකින් දක්වන්න.

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 12 වන පාඩම -ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය




1. ප්‍රසාද ස්නාපනයට සම්බන්ධව ක්‍රිස්තුන් වහන්සේ නිකදේමුස්ට පැවසූ වාක්‍ය ලියන්න.
2. ප්‍රසාද ස්නාපනය පිළිබඳ ජේසු සමිඳුන් සිය ගෝලයන්ට කළ ප්‍රකාශය ලියන්න.
3. ප්‍රසාද ස්නාපනය පිළිබඳ මහා ලියෝ සුදතුම් පියතුමාගේ ප්‍රකාශය කුමක් ද?
4. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද පහක් ලියන්න.
5. ප්‍රසාද ස්නාපනයේදී අප ලබා දෙන පොරොන්දු දෙකක් ලියන්න.
6. ආත්මික මව්පියන් සතුවිය යුතු විශේෂ සුදුසුකම් මොනවා ද?
7. ප්‍රසාද ස්නාපනයට භාවිත කරන ද්‍රව්‍ය / සංකේත නම් කර ඒවායේ අරුත් පහදන්න.
8. ප්‍රසාද ස්නාපනීය පොරොන්දු මගින් අප තුළ විය යුත්තේ මොනවා ද?
9. දේව වචනයට සාක්ෂි දරමින් තම ප්‍රසාද ස්නාපනීය කැඳවීමට පිළිතුරු දුන් අවස්ථා පහක් ලියන්න.
10. ගැළවීමේ ඉතිහාසය තුළ අභිවෘද්ධි ආලේපය ගැන ඔබ දන්නා කරුණු තුනක් ලියන්න.
11. අභිවෘද්ධි ආලේපය ලැබීමෙන් ඔබට හිමි වූ වරප්‍රසාද මොනවා ද?
12. අභිවෘද්ධි ආලේපය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් මොනවා ද?
13. පූජාප්‍රසාදිතුමෙකුට අභිවෘද්ධි ආලේපය දානය කිරීමට අවසරය ඇත්තේ කුමන අවස්ථා වල ද?
14. අභිවෘද්ධි ආලේපයෙන් ඔබ ලැබූ වරප්‍රසාද ජීවිතය ශක්තිමත් කර ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න.
15. පරිණත කිතුනු දරුවෙකු ලෙස ඔබට පැවරෙන ප්‍රධාන වගකීම් කවරේ ද?

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 13 වන පාඩම -සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන



1. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.



2. පශ්චත්තාප වන්නෙකු කළ යුතු දේ කුමක් ද?
3. මනස්ථාපනය බෙදෙන කොටස් දෙක නම් කර කෙටියෙන් හඳුන්වන්න.
4. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමේ පියවර නම් කරන්න.
5. පශ්චත්තාපී ක්‍රියා හතරක් ලියන්න.
6. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද තුනක් ලියන්න.
7. ජේසුස් වහන්සේ රෝගීන් සුවකළ අවස්ථා පහක් ලියන්න.
8. රෝගීන් සම්බන්ධව ජාකොබ් තුමා ප්‍රකාශ කළේ කුමක් ද?
9. අති උතුම් හයවන පාවුළු ශුද්ධෝත්තම පියතුමා රෝගීන්ගේ ආලේපය ප්‍රසාද නිධානය පිළිබඳව උගන්වන්නේ කුමන ව්‍යවස්ථාවේ ද?
10. රෝගීන් ආලේපය ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද පහක් ලියන්න.
11. "රෝගීන් සුව කිරීමේදී රෝගියාගේ විශ්වාසය ඉතා වැදගත් ය." යන්න ශු. බයිබලයෙන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
12. රෝගීන් ආලේප කිරීමේ පිළිවෙත ලියන්න.
13. රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානයට "අන්තිම ආලේපය" යනුවෙන් හැඳින්වීමට හේතු වූ කරුණු මොනවා ද?
14. රෝගීව සිටින ඔබේ මිතුරෙකුට කායික හා අධ්‍යාත්මික සුවය පතා කිව හැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න.
15. මෙම කොවිඩ් වසංගතය හමුවේ පීඩා විඳින රෝගී ජනතාවට සුවය පතා කිව හැකි විශ්වාසකයින්ගේ යැදුමක් නිර්මාණය කරන්න.

**2021- දෙවන වාරය**
**11 ශ්‍රේණිය**
**14 වන පාඩම -පූජකවරය**



1. ජනතා සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
2. ජනතා සේවය සඳහා යෙදෙන ප්‍රසාද නිධාන දෙක අන් ප්‍රසාද නිධානවලින් වෙනස් වන්නේ ඇයි?
3. නිල පූජකවරයේ ධූරයන් තුන මොනවා ද?
4. පූජකවරයේ පූර්ණත්වය හිමිවන ධූරය නම් කරන්න.
5. පූජාප්‍රසාදිවරු අයත් වන කොටස් දෙක නම් කර, කෙටියෙන් විස්තර කරන්න.
6. දෙව් පූජක පොරොන්දු නම් කරන්න.
7. පූජාප්‍රසාදිවරුන්ගේ වගකීම් තුනක් ලියන්න.
8. තේවාචාර්යවරුන්ගේ වගකීම් තුනක් ලියන්න.
9. පූජකතුමන් වෙනුවෙන් ගිහියන්ගේ වගකීම් මොනවා ද?
10. පූජාත්වරය දානය කරන්නේ කෙසේ ද?
11. පූජකවරය ලබා ගැනීමට සුදුසුකම් කවරේ ද?
12. ඔබේ මීසමේ පියතුමාට සේවාවන් ඉටු කිරීමට ඔබ සහය දක්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
13. දේව කැඳවීම් වැඩිකර දෙන ලෙසත්, දේව කැඳවීම් අපේක්ෂාවෙන් සිටින අයට පැමිණෙන දුර්පරීක්ෂාවලින් ජය ගැනීමටත් අවශ්‍ය වරප්‍රසාද යදිමින් යාච්ඤාවක් නිර්මාණය කරන්න.

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 15 වන පාඩම -ආශිර්වාදකාර බන්ධනය



1. විවාහය සම්බන්ධ මාක් තුමාගේ සුවිශේෂයේ 10:9 හි සඳහන් වන්නේ කුමක් ද?

2. විවාහයේ බාහිර සලකුණ කුමක් ද?

3. කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.

4. කිතුනු විවාහයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග පහක් ලියන්න.

5. විවාහ පොරොන්දුවේ ඇති ප්‍රධාන කරුණු ලියන්න.

6. කිතුනු විවාහයේ ලක්‍ෂන දෙකක් නම් කර එම ලක්‍ෂණ විස්තර කරන්න.

7. ආශිර්වාදකාර බන්ධනය දානය කරන්නේ

8. විවාහය තුළ පියතුමා ඉටු කරන වගකීම් මොනවා ද?

9. ආශිර්වාදකාර බන්ධනය හා සිවිල් නීතිය අතර වෙනස කුමක් ද?

10. කතෝලික සභාව තුළ දික්කසාදයක් නොමැත්තේ ඇයි?

11. විවාහ පොරොන්දුවට සමගාමීව ශු. පාවුලු තුමා එපීසවරුනට ලියන ලද ලිපියේ එපීස 5:31-33 හි සඳහන් කරන්නේ කුමක් ද?

12. කොරෙන්ති 7:10 ට අනුව විවාහය දෙවි සමිඳාණන් ඉදිරියේ සිදුවන උත්තරීතර එක්වීමක් වන්නේ කෙසේ ද?

13. කතෝලික විවාහ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා තිබිය යුතු ගුණාංග මොනවා ද?

14. රජයේ විවාහ රෙජිස්ටාර්වරයෙකු ඉදිරියේ විවාහ වීමට යන කතෝලිකයෙකුට ඔබ දෙන උපදෙස් මොනවා ද?

15. වර්තමාන සමාජය තුළ පවුල් ජීවිතයට එල්ල වන අභියෝග පහක් නම් කර ඒවා ජයගන්නා ආකාරය ලියන්න.

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 16 වන පාඩම -පැවිදි දිවිය



1. පැවිදි දිවියේ ආරම්භය පිළිබඳ කරුණු හතරක් ලියන්න.
2. තාපස ජීවිත ක්‍රමවත් කිරීමට පුරෝගාමී වූ අය කවු ද?
3. පැවිදි දිවියේ අරමුණ කුමක් ද?
4. තාපස පැවිදි ජීවිතයට විනය මාලාවක් සකස් කළේ කවු ද?
5. පැවිදි නිකායන් බෙදෙන කොටස් දෙක කුමක් ද?
6. පැවිදි දිවියේ වේදහාර මොනවා ද?
7. පැවිදි දිවියේ ලක්ෂණ හඳුන්වන්න.
8. පැවිදි පූජක නිකායන් තුනක් ලියන්න.
9. පැවිදි සොහොයුරන්ගේ නිකායන් හතරක් ලියන්න.
10. පැවිදි සොහොයුරියන්ගේ නිකායන් නම් කරන්න.
11. ස්වදේශක නිකායන් නම් කරන්න.
12. පැවිදි ජීවිත තුළින් අපගේ ජීවිතවලට ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න.
13. පැවිදි පූජක නිකායන්ට උදාහරණ කීපයක් හා ඔවුන්ගෙන් ලැබෙන සේවාවක් නම් කරන්න.
14. පැවිදි ජීවිතවලට පැමිණෙන අභියෝග වලට නොබියව මුහුණ දීමට අවැසි ශක්තිය යදිමින් දෙවිඳුන්ට යාවක්ඤාවක් ලියන්න.
15. පැවිදි අයගේ ධර්මදූත සේවය අගයමින් කතෝලික සඟරාවකට ලිපියක් සකස් කරන්න.

# 2021- දෙවන වාරය
# 11 ශ්‍රේණිය
# 17 වන පාඩම -ගිහි ධර්මදූත සේවය

1. කිතුනු දිවියේ කේන්ද්‍රස්ථානය කුමක් ද?
2. ජේසුස් වහන්සේ ස්ථාපිත කරන ලද පූජකවරයේ ප්‍රධාන කොටස් දෙක මොනවා ද?
3. නිල පූජකවරය ලැබෙන්නේ කා හට ද?
4. ප්‍රසාද ස්නාපනය මගින් ඔබ ලද විශේෂ වරප්‍රසාද මොනවා ද?
5. පොදු පූජකවරයෙන් ඔබ ලද ත්‍රිවිධ කාර්යයන් පහදන්න.
6. දිවැසිවර කාර්යයෙහි ප්‍රධාන දූත සේවාව කුමක් ද?
7. කතෝලික දහම් පාසල සම්බන්ධයෙන් කතෝලික සභා ධර්මෝපදේශයෙහි සඳහන් වගන්ති ලියන්න.
8. පොදු පූජකවරය ක්‍රියාත්මක කිරීමට ඔබට උදව් විය හැකි අවස්ථා පහක් ලියන්න.
9. මීසම තුළ ඔබට සාමාජිකත්වය දැරිය හැකි සමිති කවරේ ද?
10. ගිහි ධර්මදූත සේවාවේ යෙදෙන සමිති සමාගම් පහක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.

11. පහත වගුව සම්පූර්ණ කරන්න.

| | සමිතිය | අරමුණු | සේවා | විශේෂ කරුණු |
|---|---|---|---|---|
| 1. | කතෝලික දහම් පාසල | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ |
| 2. | මරිය හමුදාව (ලෙජියෝ මරියේ) | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ |
| 3. | ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදය සමිතිය | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ |
| 4. | තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය (YCS) | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ |
| 5. | සාන්ත වින්සන් ද පාවුලා සමිතිය | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ | ◆............................ ◆............................ ◆............................ |